මානුෂීය සේවායතන සමූහය

ජනවාරි 2009

CONSORTIUM OF CHA HUMANITARIAN AGENCIES (GTE) LIMITED

ISO 9001 REGISTERED

# ක්ෂණික තතු විමසුම - (Rapid Context Assessment )

### ජාතික විශ්ලේෂණය


| | |
|---|---|
| දේශපාලනය | 2 |
| පාලනය | 2 |
| ආරක්ෂක තත්ත්වය | 2 |
| මානව හිමිකම් | 3 |
| ආර්ථික සන්දර්භය | 4 |
| පරිසරය | 5 |
| මානුෂිය හා සංවර්ධන අවකාශය | 5 |
| බාහිර ක්‍රියාකාරීන් | 5 |


### දිස්ත්‍රික්ක විශ්ලේෂණ


| | |
|---|---|
| අම්පාර | 5 |
| මඩකලපුව | 5 |
| කොළඹ | 6 |
| යාපනය | 6 |
| මන්නාරම | 7 |
| ත්‍රිකුණාමලය | 7 |
| වව්නියාව | 7 |


### ප්‍රවනතාවන් විශ්ලේෂණය කිරීම

| | |
|---|---|
| දේශපාලන සංදර්භය | → |
| පාලනය | ↓ |
| ආරක්ෂක තත්ත්වය | ↘ |
| මානව හිමිකම් | → |
| ආර්ථික සන්දර්භය | ↗ |
| පරිසරය | → |
| මානුෂිය හා සංවර්ධන අවකාශය | ↘ |
| බාහිර ක්‍රියාකාරීන් | ↘ |

### දර්ශකය

| | | | | | |
|---|---|---|---|---|---|
| වෙනසක් නැත | → | මඳ ප්‍රගතියක් පෙන්වයි | ↗ | මඳ පිරිහීමක් පෙන්වයි | ↘ |
| සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වයි | ↑ | සැලකිය යුතු පිරිහීමක් පෙන්වයි | ↓ | | |

# සාරාංශය



ජනවාරි මාසය පාලනය හා නීතිය සම්බන්ධයෙන් ගත් කල කිසිසේත් ම යහපත් නොවීය. පෙට්‍රල් මිල අඩු කරන ලෙස ලබා දුන් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය රජය විසින් නොසලකා හරිනු දැකිය හැකි විය. මේ තත්වය බොහෝ දෙනෙක් විසින් අර්ථ කථනය කරනු ලැබූයේ විධායකය නීතියට වඩා ඉහලින් සිටීමක් සේය. එසේම අනෙක් අතට ප්‍රකාශ වූයේ අධිකරණය හුදෙක් නීති මය කටයුතු වලට පමණක් සීමා වෙමින් මිල නියම කිරීම හා බදු හා සම්බන්ධ කටයුතු විධායකයට පැවරිය යුතු බවයි. කෙසේ වෙතත් මෙය විධායකය හා අධිකරණය අතර වගකීම්හී සීමාවන් හඳුනා ගැනීමට කිසියම් අත්වැලක් විය.

සන්ඩේ ලීඩර් පුවත්පතේ ප්‍රධාන කර්තෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනයෙන් මාධ්‍ය නිදහසට මරු පහරක් එල්ල විය. යටත් පිරිසෙයින් මාධ්‍යවේදීන් අට දෙනක් වත් රට හැර ගොස් ඇත. බිය හා වාරණය මාධ්‍ය ක්ෂේත්‍රයේ හුරු පුරුදු වදනක් බවට පත් වී තිබේ. බීබීසී, සීඑන්එන් හා අල් ජසීරා ආදී ප්‍රවෘත්ති සපයන මාධ්‍ය පමණක් නොව ජර්මන් හා ස්විට්සර්ලන්ත තානාපතිවරුන් පවා අසාධාරණ ප්‍රකාශ නිකුත් කිරීම නිසා, රජයට හිතවාදී පාර්ශ්වයන් අතින්, විවේචනය විය.

රජය විසින් එල්ටීටීඊ සංවිධානය තහනම් කරන ලද අතර එල්ටීටීඊ සංවිධානය තහනම් කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයටත් බලපෑම් කරමින් සිටියි. එල්ටීටීඊයේ පරිපාලන අගනගරය වන කිලිනොච්චියේ බලය තහවුරු කර ගැනීමට රජය සමත් වූ අතර මේ නිසා දිවයිනේ උතුරු දකුණ යා කරන A9 මාර්ගය සම්පූර්ණයෙන් ම රජය සතු විය. මාසයේ අවසාන භාගයේ දී එල්ටීටීඊයේ හදවත සේ සැලකෙන ඊසාන දිග වෙරළේ පිහිටා ඇති මුලතිව් නගරය රජයේ හමුදා විසින් අත්පත් කර ගන්නා ලදි. මේ මාසය තුළ දකුණේ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර තුනක් වාර්තා විය.

රජයේ හමුදා හා එල්ටීටීඊ සංවිධානය අතර ගැටුම් පවතින ප්‍රදේශ වල සැලකිය යුතු සංඛ්‍යාවක් සිවිල් වැසියන් තුවාල ලබන බව නිල නොවන ආරංචි මාර්ග පවසයි. මේ ගැටුම් නිසා 200,000 පමණ සංඛ්‍යාවක් අභ්‍යන්තර අවතැන්වූවන් බිහි වී ඇති අතර ඒ අයට මානුෂීය ආධාර අවශ්‍ය වේ. ඔවුහු රජය විසින් නම් කරන ලද ආරක්ෂිත කලාපයේ සිරවී සිටිති. කෙසේ වෙතත් එල්ටීටීඊ සංවිධානය මේ සීමා නොතකා සටන් කරන බැවින් මේ ප්‍රදේශවල සිටින ජනතාව විශාල අවදානමකට මුහුණ පා සිටිති. මේ අභ්‍යන්තර අවතැන් වූවන්ගේ පහසුව සඳහා රජය විසින් මන්නාරමේ හා වවුනියාවේ කඳවුරු පිහිටුවා තිබේ. මේ අභ්‍යන්තර අවතැන් වූවන්ට අවශ්‍ය ආධාර උපකාර ලබා දීම සඳහා අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන රුපියල් මිලියන 1.9 වෙන් කර ඇත. දකුණේ සිදු වන සෝදිසි මෙහෙයුම්වලින් පසුව නිසි ආකාරව අනන්‍යතාව තහවුරු කිරීමට නොහැකි වීම නිසා දෙමළ ජාතිකයන් රඳවා ගැනීම දිගටම සිදු විය. එල්ටීටීඊ සංවිධානය විසින් වන්නි ප්‍රදේශයේ දී දරුවන් 16 පැහැරගෙන යනු ලැබූ නමුත් දින තුනකින් පසු ඔවුන් මුදා හරිනු ලැබිණි.

ආර්ථික අතින් සලකා බලන විට ජනවාරි මාසයේ දී උද්ධමනය 10.7% දක්වා පහත බැසීම හොඳම ආරංචිය සේ දැක්විය හැකිය. තෙල් මිල අඩු වීම හා දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය මෙයට හේතු වූවා වන්නට පුළුවන. අනෙක් අතට සලකා බලන විට ජාතික විදේශ මුදල් සංචිතය මාස දෙකක ආනයන වටිනාකම හා සමාන එසේත් නැත්නම් ඊට වඩා අඩු ප්‍රමාණයක අවපාතයක් පෙන්වීය. අපනයනකරුවන් ඉල්ලා සිටින්නේ ශ්‍රී ලංකික අපනයනයන් හි තරගකාරී බව දිගටම පවත්වා ගැනීම සඳහා , ඇමරිකානු ඩොලරයක් රුපියල් 130 වන සේ රුපියල අවප්‍රමාණ කරන ලෙසයි. රජය මේ ඉල්ලීම නොසලකා හරිමින් සිටින්නේ එය එසේ සිදු වුව හොත් එ මගින් ජීවන වියදම ට බලපෑමක් සිදු වන බැවිනි. විදේශගත වී සිටින ශ්‍රී ලාංකිකයන්ගෙන් ප්‍රාග්ධනය සපයා ගැනීමට මහ බැංකුව ව්‍යාපාරයක් දියත් කර ඇත. පෙට්‍රල් මිල අඩු කරන ලෙස වූ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය රජය විසින් නොසලකා හැරීම නිසා හෙජින් ගිවිසුම සම්බන්ධ පෙත්සම නිශ්ප්‍රභ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය පෙළඹිණි. මහ බැංකුව පවසන්නේ හෙජින් ගිවිසුම නීත්‍යනුකූල නොවන බවයි. කෙසේ වෙතත් මෙයට සම්බන්ධ එක් බැංකුවක් වන සිටි බැංකුව අන්තර්ජාතික මැදිහත්කරුවෙකුගේ සහය පතන බවක් පෙනේ. මේ ගිවිසුම බලාත්මක කරනු ලැබුව හොත් රටට රුපියල් බිලියන 30 සිට 80 දක්වා මුදලක් ගෙවීමට සිදුවනු ඇත.

2008 දෙසැම්බර් මැද භාගයේ සිට 2009 ජනවාරි දක්වා අතර කාලය තුළ දී ශ්‍රී ලංකාවෙන් චිකන්ගුන්යා රෝගීන් 4000 අධික ප්‍රමාණයක් වාර්තා වී ඇත. මේ වසංගතය විශාල වශයෙන් පැන නැගුණු දිස්ත්‍රික්කවල එය පාලනය කිරීමට දැරූ උත්සාහයන් සාර්ථක වී ඇති ආකාරයක් පෙනේ. මාසයේ මුල් භාගයේ දී පැවති වියලි කාලගුණ තත්වය නිසා ජල විදුලි බලාගාර ආශ්‍රිත ජලාශවල ජල මට්ටම පහත බැසීමක් සිදු වූවත් මාසයේ පසු භාගයේ දී වැසි ලැබීම නිසා මේ තත්වය පහව ගියේය. ජනගහනයෙන් 40 ප්‍රමාණයකට නල ජලය සැපයීමේ ජාතික ජල සම්පාදන හා ජලාපවාහන පනත සාකච්ඡාවට භාජනය වෙමින් තිබේ. ප්‍රතිචක්‍රීකරණය අනිවාර්ය කරන නීති රීති පිළිබඳව සලකා බැලෙමින් ඇත.

# ජාතික විශ්ලේෂණය 2008 දෙසැම්බර් 28 - 2009 ජනවාරි 28

## දේශපාලන සංදර්භය



වන්නි දිස්ත්‍රික්කයේ රජයේ හමුදා විසින් ලැබූ ජයග්‍රහණයන් නිසා ආරක්ෂක හමුදාවල චිත්ත ධෛර්යය වැඩි දියුණු වී ඇති අතර රජයේ ජනප්‍රියත්වය ද ඉහළ ගොස් තිබේ. කෙසේ වෙතත් මේ ජයග්‍රහණය පිළිබඳව උදම් අනමින් බලා සිටීමට රජයට හෝ ආරක්ෂක හමුදාවලට හැකියාවක් නොවේ. මක් නිසාද යත් එල්ටීටීඊයට ඕනෑම දෙයක් සිදු කළ හැකි හෙයිනි. අනෙක් අතට එල්ටීටීඊ සංවිධානය සමූල ඝාතනය කර ඇති අන්දමට ලෝකයේ කිසිම ත්‍රස්ත ව්‍යාපාරයක් විනාශ කළ අවස්ථාවක් ගැන අසන්නට නොලැබේ.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාව හමුදා ජයග්‍රහණ, වන්නියේ මානුෂීය අර්බුද හා මැතිවරණ සමග නව වසර ආරම්භ කළේය. පළමුව මධ්‍යම හා වයඹ පළාත්වල මැතිවරණ පැවැත්වෙනු ඇති අතර ඉන්පසු බස්නාහිර පළාත් මැතිවරණය පැවැත්වීමට නියමිතව ඇත. ඉන් අනතුරුව ඌව හා දකුණු පළාත් මැතිවරණ පැවැත්වීමට නියමිතය. එසේම මැයි මාසයේ දී පාර්ලිමේන්තු මහ මැතිවරණයක් පැවැත්වෙනු ඇත.

පෙබරවාරි 14 වෙනිදා එනම් ආදරවන්තයන්ගේ දිනයේ දී වයඹ හා මධ්‍යම පළාත් මැතිවරණ පැවැත්වෙයි. ඉතිරි පළාත් සභා තුනේ මැතිවරණ මාර්තු මාසයට නියම කර ඇති අතර උතුරු පළාත් සභා මැතිවරණය පසුව පැවැත්වෙනු ඇත.

ජනවාර්ගික අර්බුදයට යුධමය විසඳුමක් දිය නොහැකි බව හා එයට දේශපාලන විසඳුමක් අවශ්‍ය බව කියමින් ඉන්දියාව මැදිහත් වී ඇති ආකාරය පෙනේ. ඉන්දියාව සිය ආරක්ෂාව සම්බන්ධයෙන් මෙන් ම මානුෂීය වශයෙන් තමාට මුහුණ පෑමට සිදු විය හැකි අර්බුද පිළිබඳව ද අවධානයෙන් සිටියි. කෙසේ වෙතත් එල්ටීටීඊ සංවිධානයේ ඉතිහාසය පිළිබඳ සලකා බලද්දී පෙනී යන්නේ ඔවුන් කිසිසේත් ම සටන අත් නොහරිනු ඇති බවයි. ඔවුන් කුඩා කණ්ඩායම්වලට බෙදී සුවිශේෂ ඉලක්ක වෙත ගරිල්ලා ප්‍රහාර එල්ල කරනු ඇත.

රජයට තව දුරටත් ගැටලු ඇති කරමින් රජය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් අභියෝගයට ලක් කිරීම විවේචනය වෙයි. අධිකරණය, විධායකය හා ව්‍යවස්ථාදායකය පාලනය සම්බන්ධයෙන් වන ප්‍රධානතම ආයතන තුන වන අතර මෙයින් දෙකක් එනම් අධිකරණය හා විධායකය එකිනෙක හා ගැටීම ව්‍යවස්ථාදායකය තව දුරටත් දුර්වල කිරීමට හේතු වෙයි.

## පාලනය



### නීතියට ඉහළින්

ඉන්ධන මිල අඩු කිරීම සම්බන්ධයෙන් රජය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීරණයට එකඟ නොවීම නිසා මනාව පවතින ශිෂ්ට සම්පන්න සමාජයක පදනම වන නීතියට මරු පහරක් එල්ල විය. සති ගණනාවක් පුරා මේ සම්බන්ධයෙන් රජයේ ප්‍රතිචාරය කුමනාකාර වනු ඇද්ද යන්න පිළිබඳව ජනතාව බලාපොරොත්තුවෙන් පසු වූහ. කෙසේ වෙතත් රජය විසින් මේ සඳහා අයහපත් ප්‍රතිචාරයක් දැක්වීම සමාජයේ ඉහළම ස්ථරය විසින් නීතිය කඩා බිඳ දැමීමක් ලෙස දැකිය හැකි විය. මේ අර්බුදය ඇති වීමට පෙර සිටත් දේශපාලන ඝාතන හා මානව අයිතිවාසිකම් පිළිබඳව නිසියාකාරව කටයුතු කිරීමට නොහැකි වීම නිසා රජය අප්‍රසාදයට ලක් වී තිබිණි. එහි අලුත්ම තත්වය ලෙස ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් අභියෝගයට ලක් කිරීම නිසා රජය තමා නීතියට ඉහළින් තබාගෙන ඇති ආකාරය පෙනේ.

ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක සිය කටයුතු හා සම්බන්ධයෙන් තුලනාත්මකව කටයුතු සිදු කෙරෙයි. රජයේ බලය තුලනය කිරීමේ ප්‍රධානතම සාධකයන් වන මාධ්‍යය ද පසු ගිය කාලයේ දී දැඩි පීඩනයකට ලක් වී තිබිණි. එම්.ටී.වී රූපවාහිනී ආයතනයට ගිනි තැබීම, සන්ඬේ ලීඩර් ප්‍රධාන කර්තෘ ලසන්ත වික්‍රමතුංග ඝාතනය කිරීම, රිවිර කර්තෘ උපාලි තෙන්නකෝන්ට පිහියෙන් ඇන තුවාල සිදු කිරීම ආදිය නිසා ප්‍රධාන පෙළේ මාධ්‍යවේදීහු තව දුරටත් හිංසා සිදු වනු ඇතැයි යන පීඩනය සහිතව සිටිති. මෑත කාලීනව සිදු වූ හිංසා කිරීම්වලින් අනතුරුව මාධ්‍යවේදීන් අට දෙනෙක් රට හැර ගොස් ඇති බව කියවේ. 2006 සිට මේ දක්වා වන කාල සීමාව ඇතුළත මාධ-්‍යවේදීන් 50 දෛනක් පමණ ඝාතනය කිරීම්, හිංසනයට ලක් කිරීම්, පැහැරගෙන යාම් ආදියට මුහුණ පා ඇති බව රජය පිළි ගනියි.

විශේෂයෙන් ම ලසන්ත වික්‍රමතුංගගේ ඝාතනය මාධ්‍ය නිදහසට එල්ල වූ ප්‍රබල පහරක් විය. දීර්ඝ කාලයක් තිස්සේ මාධ්‍යවේදියෙක් සේ කටයුතු කර තිබූ ඔහු නොපැකිලී සිය මතය කියා පෑමට ඉදිරිපත් විය. මේ නිසා ම ඒ වටා කිසියම් මායාවක් ගොඩනැගී තිබිණි. මේ මායාවෙන් කියවුනේ මාධ්‍ය නිදහසට යම් යම් සීමා පවතින බවයි. ඔහුගේ ඝාතනයෙන් පසු මෙම මායාව බිඳී ගියේය. මේ නිසා බිය හා ස්වයං වාරණයක් ඇති වී තිබේ. මාධ්‍යවේදීන් දිගින් දිගටම හිංසනයට ලක් වීම හා ඝාතනයට ලක් වීමත් ඒ සම්බන්ධයෙන් වන පොලිස් පරීක්ෂණ ඇල් මැරුණු ස්වභාවයක් ගැනීමත් නිසා සිය හෘද සාක්ෂියට අනුව ලිවීමේ කැමැත්ත මාධ්‍යවේදීන් වෙතින් තුරන්ව ගොස් ඇති අයුරකි. මෙහි ප්‍රතිඵලයක් සේ පාලනයේ මුර බල්ලෙකු සේ කටයුතු කළ යුතු මාධ්‍යවල බලපෑම අඩු වී ඇත. මේ අනුව පරාජිතයා වන්නේ යහ පාලනයයි.

## ආරක්ෂක තත්ත්වය



නිදහස් දිනය සමරන පෙබරවාරි 4 වැනි දා ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් සේ ප්‍රකාශයට පත් කිරීමට හැකි වන අන්දමින් විමර්ශනයට ලක්වන කාල සීමාව තුළ දී මා-නුෂීය මෙහෙයුම් කඩිනම් කිරීම සිදු විය. ශ්‍රී ලංකා ජනාධිපති මෙන් ම සේනාධිනායක මහින්ද රාජපක්ෂ 2009 වසර ත්‍රස්තවාදය පරදවා ජයග්‍රහණය ලබන වසර බවට ප්‍රකාශයට පත් කර ඇත. එසේම වන්නි ප්‍රදේශයේ වල සිර වී සිටින සිවිල් වැසියන් නිදහස් කිරීමට කටයුතු නොකළ හොත් එල්ටීටීඊ සංවිධානය තහනම් සංවිධානයක් සේ ප්‍රකාශයට පත් කරන බවට ඔහු පැවසුවේය.

රජය විසින් ජනවාරි 7 වැනි දා එල්ටීටීඊ සංවිධානය තහනම් සංවිධානයක් සේ ප්‍රකාශයට පත් කරන ලදි. මෙසේ කිරීමට මූලික හේතුව සේ දැක්වූයේ එල්ටීටීඊ සංවිධානය විසින් සිවිල් වැසියන් මිනිස් පළිහක් සේ භාවිත කරමින් ඔවුන්ගේ ජීවිත අවදානමට ලක් කිරීමයි. මෙය මහජන ආරක්ෂක පනතේ වගන්ති යටතේ සිදු කරන ලද අතර මේ අනුව එල්ටීටීඊ සංවිධානය ප්‍රවර්ධනය කිරීම, දිරි ගැන්වීම හා එයට උපකාර කිරීම දඬුවම් ලැබිය හැකි වරදක් වේ. මෙම නීති උල්ලංඝනය කරන ඕනෑම අයෙක් වසර විස්සක සිර දඬුවමකට යටත් කළ හැකිය. මෙය ශ්‍රී ලංකා රජය විසින් එල්ටීටීඊ සංවිධානය තහනම් කරන ලද තෙවන අවස්ථාව සේ සැලකිය හැකිය. පළමුව 1978 දී ද ඉන්පසු 1998 ජනවාරි මස 25 වැනිදා දළදා මාලිගාවට ප්‍රහාරයක් එල්ල කිරීමෙන් පසුව ද එල්ටීටීඊ සංවිධානය තහනම් කිරීම සිදු විය. 2002 සැප්තැම්බර් 5 වැනි දා සටන් විරාම ගිවිසුම යටතේ තහනම ඉවත් කරන ලදි. දැනට රටවල් 31 ක් එල්ටීටීඊ සංවිධානය තහනම් සංවිධානයක් සේ නම් කර ඇත. රජය විසින් එල්ටීටීඊ සංවිධානය තහනම් කිරීමෙන් පසු එක්සත් ජාතීන්ගේ සංවිධනයටත් එල්ටීටීඊ සංවිධානය තහනම් සංවිධානයක් සේ නම් කිරීමට බලපෑම් කරමින් සිටියි.

ආරක්ෂක හමුදා යුධබිමේ ලැබූ විශිෂ්ටත ම ජයග්‍රහණය සේ මේ වසරේ මුල දී එල්ටීටීඊ සංවිධානයේ පරිපාලන අගනුවර වන කිලිනොච්චිය අල්ලා ගැනීම දැක්විය හැකිය. පරන්තන් සිය පාලනයට නතු කර ගැනීමෙන් පසු රජයේ ආරක්ෂක හමුදා එකිනෙකට වෙනස් දිශා තුනකින් කිලිනොච්චි නගරයට ඇතුළු වූහ. විශේෂ කාර්ය බලකා අංක 1 උතුරින් ද 57 වන බලකාය දකුණින් හා බටහිරින් ද නගරයට ඇතුළු වූහ. පරන්තන් A9 මාර්ගයේ වැදගත් ස්ථානයක් සේ හැඳින්විය හැකිය. එහි දී වැදගත් ස්ථාන හතරක් එකිනෙක හමුවේ. එනම් දකුණින් කිලිනොච්චිය, බටහිරන් පූනරින්, නැගෙනහිරින් මුලතිවු හා උතුරින් අලිමංකඩ ආදී වශයෙනි. කිලිනොච්චි දිස්ත්‍රික්කයට දළ වශයෙන් වර්ග කිලෝ මීටර් 1237 ප්‍රමාණයක් ඇතුළත් වේ. එල්ටීටීඊ සංවිධානයේ හමුදා හා දේශපාලන බුද්ධි අංශ, පොලිස් මූලස්ථානය, අධිකරණය, බැංකු හා රෝහල කිලිනොච්චි නගරයේ පිහිටා තිබිණි. අනෙක් සුවිශේෂ ජයග්‍රහණය වන්නේ අලිමංකඩ සිය පාලනයට නතු කර ගැනීමෙන් පසු ව වසර විසි තුනකට පසු රජයේ ආරක්ෂක හමුදා විසින් සම්පූර්ණ A9 මාර්ගය අල්ලා ගැනීමයි. A9 මාර්ගය මගින් ශ්‍රී ලංකාවේ උතුර හා දකුණ යා කෙරේ.

ජනවාරි 26 වැනිදා 59 වන සේනාංකය විසින් මුලතිවු නගරයේ බලය තහවුරු කර ගැනීමත් සමග එල්ටීටීඊ සංවිධානය වර්ග කිලෝ මීටර් 15x20 බිම් ප්‍රමාණකට කොටු විය. මේ වන විට එල්ටීටීඊ සංවිධානයට සිය මර්මස්ථාන 5ක් අහිමි වී ඇත. ඒවා නම් විදුතලයිතිවු, පූනරින්, කිලිනොච්චි, අලිමංකඩ හා මුලතිව් වේ. යුධ හමුදා පති තුමා ප්‍රකාශ කළ අන්දමට මෙසේ එල්ටීටීඊ සංවිධානය කුඩා බිම් පෙදෙසකට සීමා කළ හැකි වූයේ 2006 ජූලි මාසයේ සිට මානුෂීය මෙහෙයුම් සඳහා 80,000 අධික දෙනා ආරක්ෂක හමුදාවලට එක් වී සිටි බැවිනි. රාජපක්ෂ පාලන සමයේ යුද්ධය නිසියාකාරව පවත්වාගෙන නොයෑම නිසා 2005 නොවැම්බර් මාසයේ සිට සොල්දාදුවන් 3000 ප්‍රමාණයක් ජීවිතක්ෂයට පත් වී ඇති අතර 11,500

දෙනා තුවාල ලබා රෝහල් ගත කර ඇති බවට ඩිෆෙන්ස් වොච් චෝදනා කරයි. (Defence Watch). මේ වන විට රජයේ හමුදා විසින් එල්ටීටීඊ සංවිධානයට අයත් ගුවන් පථ හයක් අල්ලා ගෙන ඇත.

හතරවන ඊලාම් යුද්ධය අවසාන අදියරට පැමිණ ඇති බැවින් එල්ටීටීඊ සංවිධානය දකුණේ සිවිල් වැසියන් ඉලක්ක කර ගනිමින් එල්ල කරන ප්‍රහාර ද අඩු වී ඇති බවක් පෙනේ. මේ දක්වා වාර්තා වී ඇත්තේ සිදු වීම් තුනක් පමණි. මේ අතරින් පළමු අවස්ථාවේ දී මරාගෙන මැරෙන බෝම්බකරුවෙක් වත්තල සිවිල් ආරක්ෂක මුරපොළක් තුළින් ඇතුළු වීමට උත්සාහ දරූ අවස්ථාවේ සිදු වූ අතර එයින් 8 දෙනෙක් ජීවිතක්ෂයට පත්ව 18ක් තුවාල ලැබූහ. මෙයට සිවිල් ආරක්ෂක බලකා සාමාජිකයින් හත් දෙනෙක් ඇතුළත් වූහ. එමෙන්ම සිවිල් ආරක්ෂක කඳවුරට ද මේ හේතුව නිසා විශාල ලෙස හානි සිදු විය. දෙවන අවස්ථාවේ දී මරාගෙන මැරෙන බෝම්බකරුවෙකු කොළඹ ගුවන් හමුදා මූලස්ථානය ඉදිරිපිට බෝම්බයක් පුපුරුවා ගත්තේය. මෙයින් තිදෙනෙක් ජීවිතක්ෂයට පත් වූ අතර 37 දෙනෙක් තුවාල ලැබූහ. තුන්වන අවස්ථාවේ දී පිටකොටුවේ දෙවන හරස් වීදියේ රතු මුස්ලිම් පල්ලිය අසල බෝම්බයක් පිපිරුණු අතර මෙයින් තිදෙනෙක් තුවාල ලැබූහ.

සිවිල් ජනතාවට කිසිම හානියක් නොවේ යන උධෘත වැකිය රජය විසින් භාවිත කළත් යථාර්ථය එයින් වෙනස් වේ. එල්ටීටීඊ සාමාජිකයන් ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් මෙහෙයුම් හා ඔවුන්ට සහයෝගය සපයමින් ගොඩබිමින් එල්ල කරන ප්‍රහාර නිසා සිවිල් ජනතාව ජීවිතක්ෂයට පත් වීම හා තුවාල ලැබීම සිදු වේ. ඩී. එස්. බී සෙල්වරාජ් කොලමේ රාජ්‍ය නියෝජිත එස්මෙල්ඩා සුකුමාර්, සතියක් ඇතුළත සිවිල් වැසියන් 100 පමණ ජීවිතක්ෂයට පත්වනු හා 300 කට වැඩි ප්‍රමාණයක් තුවාල ලබනු තමා දුටු බව පවසයි.

නිල නොවන වාර්තා දක්වන අන්දමට ජනවාරි 22 වැනි දා ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාව විසින් යුධ මුක්ත කලාපය සේ නම් කර ඇති කලාපයට ගුවන් හමුදාව විසින් ප්‍රහාරයක් එල්ල කර ඇත. මේ අතර යුධ මුක්ත කලාපයට පැමිණීම සම්බන්ධයෙන් ආරක්ෂක හමුදා එල්ටීටීඊ සංවිධානයට චෝදනා කරමින් සිටියි.
වන්නි ප්‍රදේශයේ සිර වී සිටිමින් අවදානමට මුහුණ පා සිටින්නේ සිවිල් වැසියන් පමණක් නොවේ. මාධ්‍යවේදීන් ද අවදානමට මුහුණ පා සිටිති. මෙහි නවතම ගොදුරු වන්නේ සිය මෝටර් රථයෙන් සේවා ස්ථානය කරා යමින් සිටිය දී නාඳුනන තුවක්කුකරුවන් විසින් ඝාතනය කරනු ලැබූ ලසන්ත වික්‍රමතුංග හා ප්‍රහාරයට ලක් වූ රිවිර ප්‍රධාන කර්තෘ උපාලි තෙන්නකෝන් ය. මීට අමතරව එම්ටීවී/ එම්බීසී මාධ්‍ය ජාලයට නාඳුනන පිරිසක් විසින් එල්ල කරන ලද ප්‍රහාරය නිසා රුපියල් මිලියන ගණනක පාඩුවක් සිදු විය.

පල්ලියක් මගින් පවත්වාගෙන යන අනාථ කඳවුරකින් එල්ටීටීඊ සංවිධානය විසින් දරු-වන් පැහැර ගෙන යන ලද බවට වාර්තා විය. ආරක්ෂක අමාත්‍යංශය විසින් පෙන්වා දෙන ලද අන්දමට ළමා සොල්දාදුවන් ලෙස පුහුණු කිරීමට හා මරාගෙන මැරෙන බෝම්බ කරුවන් ලෙසින් පුහුණු කිරීමට වයස අවුරුදු 12ට වැඩි දරුවන් 30 දෙනෙක් පැහැරගෙන ගොස් තිබේ. පසුව දරුවන් 16 දෙනෙක් නිදහස් කර ඇත.

විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ පැවසුවේ 2002 සටන් විරාමය දුන් ලබන යුධ ජයග්‍රහණවලට මග පෑදූ බවයි. එසේම සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු මිලට ගත් අවි ආයුධ නිසා සාර්ථක ලෙස සටන් මෙහෙයවීමට හැකි වූ බවත් ඔහු පැවසුවේය. හමුදාපති ලුතිනන් ජෙනරාල් සරත් ෆොන්සේකා පෙන්වා දෙන්නේ මෑත කාලීන යුධ ජයග්‍රහණ හා කරුණා අම්මාන් එල්ටීටීඊය හැර දැමීම එකිනෙක හා සම්බන්ධ කිරීම ලැජ්ජා සහගත කරුණක් බවයි. පැහැදිලිවම කරුණා අම්මාන් එල්ටීටීඊය හැර ආවේ නෝර්වේ රජය මගින් සංවිධානය කරන ලද සාම සාකච්ඡා සිදු වන අවස්ථාවේ දී ය.

*යුද්ධය කොයි තරම් අත්‍යවශ්‍ය වුවත්, කොයි තරම් සාධාරණීකරණය කළ හැකි වුවත් අපරාධයක් නොවන බව නොසිතන්න.*

***අර්නස්ට් හෙමින්වේ***

# මානව හිමිකම්

**දෙසැම්බර් 21 සිට ජනවාරි 20 දක්වා ඒ ඒ දිස්ත්‍රික්කයේ වාර්තා වූ මානව හිමිකම් උල්ලංඝනයන්**"පහත වගුව මගින් පෙන්නුම් කරන්නේ මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කරන ලද විවිධ උල්ලංඝනයන්ය. (ඩේලි මිරර්, වීරකේසරී, තිනකුරල්, සුදර් ඔලි, උදයන්)

දෙසම්බර් 21 වැනිදා සිට ජනවාරි 20 වැනි දා දක්වා
මානව හිමිකම් විශ්ලේෂනය




(විවිධ මුද්‍රිත හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය වලින් වාර්තා වූ ආකාරයට ඩිෆෙන්ස්, ඩේලි මිරර්, වීරකේසරී, සුදර්ඔලි, උද-යන්)

- ලසන්ත වික්‍රමතුංග ඝාතනය කරන ලදි.
- මොණරාගල දී දෙමළ වැසියන් දෙදෙනෙක් වෙඩි තබා ඝාතනය කෙරිණි.
- එම්ටීවී මාධ්‍ය ජාලයට ප්‍රහාරයක් එල්ල විය.
- කොළඹ වැසියන් නැවත ලියාපදිංචි කරවීම (citizens.lk වෙබ් අඩවියේ ලියාපදිංචි කිරීම)
- අභ්‍යන්තර අවතැන් වූවන් 52ක් මුලතිව් සිට මන්නාරමට පැමිණීම
- වන්නියේ යුධ ගැටුම් හා ගංවතුර නිසා 350,000 දෙනා අවතැන් වීම.
- නෙත් එෆ් එම් සේවයේ මහින්ද රූපසිංහට මරණ තර්ජන එල්ල වීම.
- පවුල් 74ක් වන්නියේ සිට මැනික්ෆාම් වෙත පැමිණීම.

| දිනය | අත්අඩංගුව ට ගැනීම | පැහැරගෙන යාම | ඝාතනය කිරීම | තුවාල සිදු කිරීම | අතුරුද න්වීම |
|---|---|---|---|---|---|
| 2008 දෙසැම්බර් 21 | 2 | | 2 | 1 | |
| 2008 දෙසැම්බර් 22 | | | 2 | 5 | |
| 2008 දෙසැම්බර් 23 | 9 | 16 | 3 | | |
| 2008 දෙසැම්බර් 24 | | | 3 | | 1 |
| 2008 දෙසැම්බර් 25 | | 1 | | | |
| 2008 දෙසැම්බර් 26 | | | 1 | 1 | |
| 2008 දෙසැම්බර් 27 | 1 | | 3 | 14 | |
| 2008 දෙසැම්බර් 28 | 66 | 1 | 3 | 7 | |
| 2008 දෙසැම්බර් 29 | | 1 | 2 | | |
| 2008 දෙසැම්බර් 31 | | | 2 | | |
| 2009 ජනවාරි 01 | 11 | 1 | 5 | 22 | |
| 2009 ජනවාරි 02 | 1 | | 6 | 41 | |
| 2009 ජනවාරි 03 | 1 | 4 | 1 | 4 | 1 |
| 2009 ජනවාරි 04 | 106 | | 1 | | |
| 2009 ජනවාරි 05 | 25 | | 1 | | |
| 2009 ජනවාරි 06 | 35 | | 2 | | |
| 2009 ජනවාරි 07 | 1 | | | 1 | 1 |
| 2009 ජනවාරි 08 | 4 | | 9 | 29 | |
| 2009 ජනවාරි 09 | | | 9 | 7 | |
| 2009 ජනවාරි 10 | 6 | | 12 | 10 | |
| 2009 ජනවාරි 11 | 5 | 2 | | 50 | 1 |
| 2009 ජනවාරි 12 | 1 | | 1 | | |
| 2009 ජනවාරි 13 | | | 7 | 20 | |
| 2009 ජනවාරි 14 | | | 2 | 13 | |
| 2009 ජනවාරි 15 | | | 8 | 15 | |
| 2009 ජනවාරි 16 | 1 | | 5 | 7 | |
| 2009 ජනවාරි 17 | 2 | | 19 | 45 | |
| 2009 ජනවාරි 18 | 17 | 2 | 3 | 3 | |
| 2009 ජනවාරි 19 | | | 2 | 10 | |
| 2009 ජනවාරි 20 | 1 | | 21 | 52 | |

- වට්ටක්කච්චි හි සිට සිවිල් වැසියන් 15 දෙනෙක් විශ්වමඩු වෙත පැමිණීම.
- සරණාගතයින් 28 දෙනෙක් වවුනියාවේ සිට අරිචමුනෛ රාමේස්වරන් වෙත පැමිණීම.
- වව්නියාවේ කාන්තාවක් පැහැරගෙන යාම.
- වව්නියාවේ ගනේසපුරම් මහා විද්‍යාලයේ විදුහල්පතිතුමාට වෙඩි තැබීම.
- පල්ලියක් මගින් පවත්වා ගෙන යන අනාථ නිවාසයකින් දරුවන් 16 දෙනෙක් එල්ටීටීඊ සංවිධානය විසින් පැහැර ගෙන යනු ලැබීම.
- බණ්ඩාරවෙල පූනගල වතු යායේ දී එල්ටීටීඊයේ පොලිස් නිලධාරියෙක් අත් අඩංගුවට ගැනීම.

**අත්අඩංගුවට ගැනීම් හා පැහැරගෙන යාම්**

අදාළ කාල සීමාව තුළ සෝදිසි මෙහෙයුම් තුළින් සැකකරුවන් 295 දෙනෙක් අත්අඩංගුවට ගෙන ඇත. කිසියම් ස්ථානයක රැඳී සිටීමට හේතු පැහැදිලි කිරීමට අපොහොසත් වීම හා සිය අනන්‍යතාව තහවුරු කිරීමට නොහැකි වීම නිසා මෙසේ අත් අඩංගුවට ගැනීම සිදු වී තිබේ. වාර්තාවලට අනුව වැඩිම අත් අඩංගුවට ගැනීම් ප්‍රමාණයක් (202) වාර්තා වන්නේ කොළඹිනි. වත්තල සිවිල් ආරක්ෂක බලකා මුරපොලට එල්ල වූ ප්‍රහාරයෙන් හා කොම්පඤ්ඤවීදියේ ගුවන් හමුදා මූලස්ථානයට එල්ල වූ ප්‍රහාරයෙන් පසු කොළඹ ප්‍රදේශයෙන් බොහෝ දෙනෙක් අත්අඩංගුවට ගැනීම සිදු විය. උතුරු හා නැගෙනහිර පළාත්වල පුද්ගලයන් නැවත ලියාපදිංචි කරනු ලැබූ අවස්ථාවේ දී ජනවාරි 4 වැනි දා පුද්ගලයින් 104 දෙනක් අත්අඩංගුවට ගැනිණි.

වැඩි වශයෙන් සෝදිසි මෙහෙයුම් හා අත් අඩංගුවට ගැනීම් සිදු වූයේ කොළඹ ප්‍රදේශයේ වන අතර දෙවන ස්ථානයට පත්වන්නේ ගම්පහ දිස්ත්‍රික්කයයි. එහි සිදු වූ සෝදිසි මෙහෙයුම්වල දී 40 දෙනෙක් අත් අඩංගුවට ගනු ලැබිණි.

අදාළ කාල සීමාව තුළ පැහැර ගෙන යෑම් වල අඩුවීමක් දක්නට ලැබේ. දෙසැම්බර් මස 23 වැනිදා වන්නි ප්‍රදේශයේ කතෝලික පල්ලියක් විසින් පවත්වාගෙන යන අනාථ නිවාසයකින් දරුවන් 16 දෙනෙක් එල්ටීටීඊ සංවිධානය විසින් පැහැරගෙන ගියබව වාර්තා විය. ඔවුන්ගෙන් කිහිප දෙනෙක් පසුව නිදහස් කරනු ලද බව මන්නාරමේ වික්ටර් සූසෛ පියතුමා ඒශියා නිව්ස්වලට පවසා ඇත. වයස අවුරුදු 12 පමණ වයසේ සිටින දරුවන් ළමා සොල්දාදුවන් සේ පුහුණු කිරීමට නිරන්තරයෙන් එල්ටීටීඊ සංවිධානය විසින් පැහැර ගෙන යනු ලැබේ.

මේ කාල සීමාවේ දී මොණරාගල ප්‍රදේශයේ සිංහල වැසියන් දෙදෙනෙක් පැහැරගෙන යනු ලැබිණි. මීට පෙර පැහැර ගෙන යාමක් වාර්තා වූයේ 2008 ඔක්තෝබර් මාසයේ දීය. ඒ අවස්ථාවේ දී ගොවියන් තිදෙනෙක් පැහැරගෙන යාම සිදු විය.

2009 ජනවාරි/පෙබරවාරි කාලය තුළ කොළඹ ප්‍රදේශයෙන් පුද්ගලයින් තිදෙනෙක් අතුරුදන් වූ බවට වාර්තා වූ අතර යාපනයෙන් දෙදෙනෙක් අතුරුදන් විය.

**ඝාතනය කිරීම් හා තුවාල සිදු කිරීම්**

දෙමළ පුවත්පත් වාර්තා කරන අන්දමට මුලතිව් හා කිලිනොච්චි දිස්ත්‍රික්කවලින් පිළිවෙළින් 62 කු හා 20 කු ඝාතනයට ලක්ව ඇත. මේ සියලුම මරණ ගුවන් ප්‍රහාර නිසා සිදු වූ ඒවා වේ. මේ හේතුව නිසාම පුද්ගලයින් 202ක් හා 65ක් තුවාල ලබා ඇත. අදාළ කාල සීමාව තුළ දී කොළඹ ප්‍රදේශයේ සිදුවූ බෝම්බ පිපිරීම් දෙක නිසා 25 දෙනෙක් තුවාල ලැබීය.

වඩමාරච්චියේ සිදු වූ ෂෙල් ප්‍රහාර නිසා 40 දෙනෙක් තුවාල ලැබූහ. ගැටුම් පවතින කලාපයේ සිට පළා එමින් සිටි පිරිමින් කාන්තාවන් හා දරුවන්ගෙන් සමන්විත 57 දෙනෙකුගේ කණ්ඩායමකට කන්ච්පුරම් හි දී වෙඩි තබනු ලැබිණි. දරුවන් දෙදෙනෙක් ඇතුළු හත් දෙනෙක් මිය ගිය අතර හතර දෙනෙක් තුවාල ලැබූහ.

කලින් කාල සීමාව හා සන්සන්දනය කර බැලීමේ දී මඩකලපු දිස්ත්‍රික්කයේ හිංසන ක්‍රියා අඩු වී ඇති බවක් පෙනේ. නාඳුනන කණ්ඩායම් විසින් දෙමළ වැසියන් තිදෙනෙක් ඝාතනය කර ඇති අතර එල්ටීටීඊ සාමාජිකයන් බවට සැක කළ හැකි පිරිසක් විසින් ගම්වැසියන් පිරිසකට පහර දී තිදෙනෙක් කපා කොටා ඝාතනය කර ඇත. මොණරාගල දිස්ත්‍රික්කයේද ගම්වැසියන් තිදෙනෙකුට තුවාල සිදු කර ඇත. මීට කලින් මොණරාගල දිස්ත්‍රික්කයෙන් මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් වාර්තා වූයේ මාස දෙකකට ඉහත දී ය.

| | |
|---|---|
| තනි පුද්ගල ඝාතනයන් | 26 |
| පිපිරීම් නිසා සිදු වූ මරණ | 78 |
| විශේෂිත පුද්ගලයන් ඉලක්ක කරගෙන සිදු වූ ඝාතනය කිරීම් | 1 |
| සටන් කරුවන් නොවන අය ඝාතනය කිරීම් | 7 |
| මළ සිරුරු සොයාගැනීම් | 20 |

(hrac1@cha.lk මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර ලබා ගත හැකිය.)

## ආර්ථික සන්දර්භය

2009 ජනවාරි මාසයේ දී ආර්ථිකය සම්බන්ධයෙන් යහපත් ආරංචියක් සේ සැලකිය හැක්කේ උද්ධමනය 10.7% දක්වා පහළ බැසීමයි. මහ බැංකුවේ දැඩි මූල්‍ය පනත හා ඉන්ධන මිල පහළ බැසීම මෙයට හේතු වන්නට ඇත. කෙසේ වෙතත් මේ උද්ධමය කෙටි කාලීන විය හැකිය. මක් නිසාද යත් ලෝක ආර්ථික අර්බුදය අවසන් වීමෙන් පසු නැවත ඉන්ධන මිල ඉහළ යනු ඇති බැවිනි. බැංකුව දීර්ඝ කාලීන ෆිස්කල් අඥාවක් පනවන ආකාරයක් පෙනෙන්නට නැත. කොටස් 200 මගින් බැංකු හරපත් 17% ප්‍රමාණයකින් අඩු කිරීම පිණිස කොටස් නැවත මිලට ගැනීමේ දී අය කරන දඩ මුදල සඳහා වන පොලී අනුපාතිකය අඩු කර ඇත. 2008 මිල ගණන් 20% කින් ඉහළ ගියේය. මේ නිසා ජනතාවගේ මූලික වැටුප් අඩු වී ඇති අතර අපනයනයන් හි තරගකාරී බව අඩු වී ඇත.

ජනවාරි මාසයේ වැඩි අවධානය යොමු වූයේ රටේ බාහිර ප්‍රාග්ධනය කෙරෙහිය. 2008 නොවැම්බර් මාසයේ දී මහ බැංකුව විසින් දක්වන ලද අන්දමට ඩොලර් බිලියන 2.6 ක විදේශ සංචිත ශ්‍රී ලංකාව සතු වේ. මෙය රටේ මාස දෙකක ආනයනයන් සඳහා ප්‍රමාණවත් වනු ඇත. එහෙත් බැංකුව විසින් නිකුත් කරන ලද නිල වාර්තා මගින් කියවෙන අන්දමට බැංකුව සතුව ඇත්තේ ඩොලර් බිලියන 2ක ප්‍රමාණයක් පමණි. අද වන විට මේවා තව දුරටත් පහත බැස තිබීමට ඉඩ ඇත.

1970 ගණන් වල ක්‍රියාත්මක කරන ලද ආකාරයේ ආනයන සීමා පැනවීමෙන් මේ සංචිතයන් ආරක්ෂා කර ගැනීම කළ නොහැක. මීට පටහැනිව පසුගිය මාසයේ දී ජ්‍යෙෂ්ඨ බැංකු කරුවන් දෙදෙනෙක් ප්‍රසිද්ධියේ නිර්දේශ කළේ මුළ ගිණුම නිදහස් කිරීම සුදුසු බවයි. ඩොලරයේ අගය රුපියල් 130ක් වන සේ රුපියලේ අගය අව ප්‍රමාණ කිරීම තවත් විකල්පයකි. අපනයනකරුවන්ට රුපියල අවප්‍රමාණ කිරීමට අවශ්‍ය වුවත් මහ බැංකුව මේ අදහස ක්‍රියාත්මක නොකරන්නේ එමගින් ජීවන වියදම ඉහළ යා හැකි බැවිනි. මෙය හේතු දෙකක් නිසා කෙටි කාලීන විසඳුමක් සේ දැකිය හැකිය. පළමුව අපනයන අංශය තිරසාරව පවත්වා ගැනීම දීර්ඝ කාලීන වර්ධනය සඳහා වැදගත් වන අතර දෙවනුව කෙටි කාලීන වශයෙන් රුපියල අවප්‍රමාණ නොකර සිටීම නිසා විදෙස් ණය බර වැඩි වීමයි.

IMF සහය පැතීම අවසන් තුරුම්පුව වනු ඇත්තේ එමගින් රුපියල අවප්‍රමාණ කිරීම හා මිහින් එයා වැනි ව්‍යාපෘති වෙනුවෙන් වැය කරන මුදල් කප්පාදු කිරීමට උපදෙස් ලැබෙනු ඇති බැවිණි. විදේශවල සිටින ශ්‍රී ලාංකිකයන් අරමුණු කරගෙන විදේශ මුදල් ආයෝජනය කිරීමේ වැඩ පිළිවෙලක් මහ බැංකුව විසින් දියත් කර ඇත. මේ තුළින් ඩොලර් මිලියන 500 ප්‍රමාණයක් උපයා ගැනීමට මහ බැංකුව අපේක්ෂා කරයි. මේ වෙනුවෙන් 20% ප්‍රිමියම් පොළියක් ගෙවීමට අපේක්ෂා කරයි.

අධිකරණයේ තීන්දු නොසලකා හරිමින් රජය විසින් ඉන්ධන මිල අඩු නොකිරීම නිසා හෙජින් ගිවිසුම පිළිබඳ පෙත්සම නිශ්ප්‍රභ කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළේය. මෙය ව්‍යවස්ථාදායකයේ බිඳ වැටීමක් සේ සමහරු දකිති. එහෙත් මෙය අධිකරණය හා විධායකය අතර බලය බෙදී යන්නේ කෙසේද යන්න තීරණය කිරීමට සුදුසු අවස්ථාවකි.

මහ බැංකුව විසින් පෙන්වා දෙන ලද අන්දමට හෙජින් ගිවිසුම නීති විරෝධී වේ. මේ සඳහා සම්බන්ධ වූ බැංකු පහෙන් එකක් වන සිටි බැංකුව අන්තර්ජාතික මැදිහත්කරුවෙකුගේ සහය පතමින් සිටියි. මෙම ගිවිසුම බලාත්මක කරනු ලැබුව හොත් ලංකා පෙට්‍රෝලියම් සංස්ථාවට ඩොලර් මිලියන 300 සිට 800 දක්වා ප්‍රමාණයක් ගෙවීමට සිදු වනු ඇත. පසුගිය මාසයේ ප්‍රීමා පිටි සමාගම මගින් මැදිහත්කරුවෙකුගේ සහාය ලබා ගැනීම නිසා රජයට ඔවුන් වෙත ඩොලර් මිලියන 35 ගෙවීමට සිදු විය.

ගොල්ඩන් කී ක්‍රෙඩිට් කාඩ් සමාගම බිඳ වැටීම නිසා තැන්පත් කරුවන්ට අපේක්ෂිත රුපියල් මිලියන 14ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අහිමි විය. මේ නිසා මූල්‍ය සමාගම්වල තැන්පත් කිරීම් අඩු වූ බව වාර්තා වී ඇත. කෙසේ වෙතත් මහ බැංකුව පවසන්නේ ගොල්ඩන් කී මෙයට වග කිව යුතු නැති බවයි.

2008 වර්ෂයේ දී පැමිණි මුළු සංචාරක සංඛ්‍යාව 438,475 වේ. මෙය 2007 වර්ෂයේ පැමිණි ප්‍රමාණය වන 494,008 න් 20 ක අඩු වීමකි. සංචාරක කර්මාන්තය නගා සිටුවීම සඳහා රජය විසින් රුපියල් මිලියන 400 ක් වෙන් කර ඇත. ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන ක්ෂේත්‍රයට, භාරතී එයා ටෙල් නමින් නව සමාගමක් එක් විය.

අපනයනයන් සම්බන්ධයෙන් සලකා බලන විට කුරුඳු, ආභාරණ හා රබර් දුර්වල වෙළඳපල තත්වයක් පෙන්නුම් කළ නමුත් තේ මිල ක්‍රමයෙන් ඉහළ යන්නට විය.

GSP බදු තව වසර තුනක කාලයක් සඳහා දීර්ඝ කිරීම සඳහා රජය යුරෝපයේ විශාල ව්‍යාපාරයක් ගෙනයමින් සිටියි.

## පරිසරය

දෙසැම්බර් මැද භාගයේ සිට ජනවාරි දක්වා වන කාලය අතරතුර ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් චිකුන්ගුන්යා රෝගීන් 4000 අධික ප්‍රමාණයක් වාර්තා වී ඇත. ජනවාරි මාසයේ මුල් භාගයේ මෙම තත්වය වැඩි දුරටත් හිස ඔසවන ආකාරයක් පෙණුනත් එය වලක්වා ගැනීමට ගත් විවිධ ක්‍රියාමාර්ග හමුවේ වයඹ, ඌව, සබරගමු හා නැගෙනහිර පළාත්වල චිකුන්ගුන්යා තත්වය පාලනය කිරීමට හැකි වී තිබේ. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රධාන තැනක් ගත්තේ මදුරුවන් බෝ වන ස්ථාන (කසල, ටයර්, බඳුන්) බැහැර කිරීමයි. මොණරාගල, පොළොන්නරුව, ඇඹිලිපිටිය හා කල්මුණේ ප්‍රදේශවල මදුරුවන් වඳ කිරීම සඳහා ධූමිකා උපයෝගී කර ගැනීම ද සිදු විය. මදුරුවන් නිසා බෝ වන රෝග සෘජුව ම පාරිසරික ක්‍රියාකාරකම් හා බැඳී පවතියි. මක් නිසාද යත් පරිසරය නොසළකා හරිනු ලැබූ විට මදුරුවන් බෝවන ස්ථාන වැඩි වීම නිසාය.

ජනවාරි මාසයේ වැසි ආරම්භ වීමත් සමග ගම්පොළ ප්‍රදේශයේ සුළු පරිමාණ නාය යෑමක් සිදු විය. මේ නාය යෑම නිසා පුද්ගලයින් 180 දෙනෙක් අවතැන් වූ බව වාර්තා වූ අතර නිවාස 5ක් විනාශ විය. මේ මාසයේ මුල් භාගයේ දී ඇති වූ වර්ෂා තත්වය නිසා මඩකලපුව හා අවට ප්‍රදේශවල ගංවතුර තත්වයක් ඇති විය. කෙසේ වෙතත් මාසයේ වැඩි පුර කාලයක් පැවතියේ වියලි කාලගුණයකි. විශේෂයෙන් ම දකුණු හා මධ්‍යම පළාත්වල වියලි කාළගුණයක් දක්නට විය. මෙසේ වියලි කාලගුණයක් පැවතීම නිසා ජලවිදුලි බලාගාර ආශ්‍රිත ජලාශවල ජල මට්ටම පහත යනු දකිය හැකි වූ අතර මේ නිසා විදුලි සැපයුම සීමා වී විදුලිය හා ජලය කප්පාදු කිරීමේ අවදානමක් ඇති විය. කෙසේ වෙතත් මාසයේ අවසාන භාගයේ දී වැසි ලැබීම නිසා මේ අවදානම යම් තාක් දුරකට අඩු විය.

2009 ජනවාරි මාසයේ දී ජාතික ජල සම්පාදන හා ජලාපවාහන පනත සම්බන්ධයෙන් අදහස් පළ කිරීමට ආරාධනා කෙරිණි. මෙම පනතේ මූලික අරමුණ වන්නේ 2011 වන විට ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් 40% ප්‍රමාණයකට නල ජල පහසුකම් ලබා දීම හා 3% ප්‍රමාණයකට ජලාපවහන පහසුකම් ලබා දීමයි.

කසල වෙන් කර ප්‍රතිචක්‍රීකරණය කිරීම් අනිවාර්ය කරන නීති හා කසල තැන තැන දැමීම සම්බන්ධයෙන් දඬුවම් පැමිණවිය හැකි නීති රීති හඳුන්වා දීම සිදු විය.

## මානුෂීය හා සංවර්ධන අවකාශය

### මානුෂීය සංවර්ධනය

මේ මාසය තුළ දී වන්නි දිස්ත්‍රික්කයේ විශාල වෙනසක් සිදු වුයේ කිලිනොච්චියේ හා මුලතිව් හා සම්පූර්ණ සිවිල් ජනගහනය ම අවතැන් වී මන්නාරමෙන් හා වව්නියාවෙන් පැමිණි ජනතාව සමග එක්වී අභ්‍යන්තර අවතැන් වූවන් බවට පත් වීම නිසාය. දැනට ඔවුන් ආරක්ෂිත කලාපයට කොටු වී සිටින අතර එල්ටීටීඊ සාමාජිකයන් ආරක්ෂක කලාපයට ඇතුළු වීම නිසා එයින් පිටතට විසි වෙමින් සිටිති. මේ නිසා සිවිල් ජනතාවට තුවාල සිදු වීම් දක්නට ලැබුණු අතර සටන් දිගින් දිගටම පවතියි. මේ ප්‍රදේශ සඳහා අවශ්‍ය සැපයීම් රජයේ හා එක්සත් ජාතීන්ගේ රථ මගින් සිදු කරයි. මේ ප්‍රදේශවල පවත්නා තත්වය බෙහෙවින් අවදානම් සහිතවන අතර මේ ප්‍රදේශවලින් ඉවත් වීම කඩිනමින් සිදු කළ යුතු අත්‍යවශ්‍ය කටයුත්තකි. තුවාල ලැබූවන් වව්නියාවට ගෙන ඒව දුෂ්කර වී ඇත. වව්නියාවේ හා මන්නාරමේ ග්‍රාමීය කඳවුරුවල පුද්ගලයින් 200,000 පමණ නවාතැන් දීමට රජය අපේක්ෂා කරයි.

එමෙන්ම යාපනයේ ගංවතුර තත්වය පහව යාමෙන් පසු ඒ ප්‍රදේශයට තවත් අවශ්‍යතාවන් වේ.

ස්වේච්ඡා සේවාවන් සඳහා ඇත්තේ දැඩි අවශ්‍යතාවකි. ආයතන එකිනෙකා සමග සහයෝගයෙන් කටයුතු කිරීම නිසා නිරීක්ෂණ සිදු කිරීමේ දී ඇතිවන දුෂ්කරතාවන් මග හැර ගැනීමට හැකි වී තිබේ. CGES වැඩි දියුණු කර ගැනීම හා විපතට පත් වූවන්ට විකල්ප ආහාර ලොරි යැවීම සම්බන්ධයෙන් නිරතුරුව ආයතන අතර සන්නිවේදන කටයුතු සිදු වන අතර රැස්වීම් පැවැත්වේ.
කඳවුරු භූමිවල සුරක්ෂිතභාවය, සහනසේවා ආයතන වෙත ළඟා වීමේ හැකියාව, අභ්‍යන්තර අවතැන් වූවන්ගේ සංචරන නිදහස හා ළමා අධ්‍යාපනය ආදිය සම්බන්ධයෙන් පසුගිය මාසයේ IASC කණ්ඩායම් රැස්වීමේ දී සාකච්ඡාවට භාජනය විය.

## බාහිර ක්‍රියාකාරීන්

දීර්ඝ කාලයක් තිස්සේ උතුරේ පැවති ජනවාර්ගික ගැටුම් නිමා වෙමින් පවතින අතර මේ නිසා සිවිල් වැසියන්ට ඇති වී ඇති බලපෑම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ, ද්විපාර්ශ්වික ආණ්ඩු හා ඉන්දියාවේ අවධානය යොමු වී ඇත. අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන විසින් රුපියල් බිලියන 1.9 මුදලක් පෙන්වා ඇති අතර, මෙය අභ්‍යන්තර අවතැන් වූවන්ගේ අවශ්‍යතා වෙනුවෙන් වැය කිරීමට අපේක්ෂිතය.

සිවිල් වැසියන් සම්බන්ධයෙන් ඇති බලපෑම හා සමග බීබීසී, සීඑන්එන් හා අල් ජසීරා වැනි ආයතන දැඩි සේ විවේචනයට ලක් වෙමින් පවතියි. එසේම ජර්මනිය හා ස්විට්සර්ලන්ත තානාපතිවරුන් හා අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධානද දැඩිසේ විවේචනය වෙමින් පවතියි. මෙයට හේතු වී ඇත්තේ කලින් සඳහන් කළ ප්‍රවෘත්ති නාලිකා වල විකාශය වූ රූගත කිරීම් හා යූ ටියුබ් හි දක්නට ලැබෙන දර්ශන කිහිපයකි. මේවා මගින් ලෝක මතය හැඩගැස්වීම සිදු වේ.

# දිස්ත්‍රික්ක විශ්ලේෂණ - 2008 දෙසැම්බර් 28 - 2009 ජනවාරි 28

## අම්පාර

### ව්‍යුහයන්

අම්පාරේ තත්වය සාපේක්ෂ වශයෙන් ස්ථාවරව පවතියි. ප්‍රජාවන් අතර සහ සහසම්බන්ධතා හා දේශපාලන පරිසරය ද ස්ථාවරය. රජයේ ආයතන මෙන්ම වෙනත් සංවිධාන ද ප්‍රජා සංවර්ධන ක්‍රියාවලියේ යෙදී සිටිති. ආරක්ෂක තත්වය සම්බන්ධයෙන් සලකා බලන විට එල්ටීටීඊය හා ආරක්ෂක හමුදා අතර ගැටුම් අඩු වී ඇති බව පෙනේ. මෙසේ සිදු වීමට හේතුව ආරක්ෂක හමුදාව උතුරු ප්‍රදේශයේ සටන සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර සිටීම වන්නට පුළුවන. එසේම මුළු ස්ත්‍රික්කය පුරාම පැහැරගෙන යාම් මංකොල්ලකෑම් ආදී පැරාමිලිටරි ක්‍රියාකාරකම් ද අඩු වී තිබේ. කලවංචිකුඩි හා බදුල්ල චෙන්කලාඩි මාර්ගයේ ආරක්ෂක තත්වය වැඩි දියුණු වී තිබේ. මේ හේතුව නිසා මේ ප්‍රදේශවල සිවිල් ජනතා සංසරණය කිසියම් දුරකට ඉහල නැග ඇත.

ප්‍රදේශයේ සාපේක්ෂව පවත්නා සාමකාමීබව බිඳවැටුණු එක් අවස්ථාවක් සේ මාලිගාවිල දී එල්ටීටීඊ සාමාජිකයන් විසින් සිවිල් වැසියන් තිදෙනෙක් ඝාතනය කළ අවස්ථාව දැක්විය හැකි වේ. මෙවන් අවාසනාවන්ත සිදුවීම්වලින් වැලකීමට තාවකාලිකව සිය නිවෙස්වලින් පිටවී සිටින ලෙස පොලිසිය විසින් මායිම් ගම්මානවල වෙසෙන සිවිල් වැසියන්ට දැනුම් දී ඇත.

### ක්‍රියාකාරීන්

ටීඑම්වීපීය හා සෙසු දේශපාලන පක්ෂ, රජයේ ආරක්ෂක හමුදා ප්‍රධාන ක්‍රියාකාරීන් සේ පවතියි.

### ක්‍රියාත්මකවන ආකාරය

මාලිගාවිල දී සිවිල් වැසියන්ට එල්ල කරන ලද ප්‍රහාරය වැනි වූ මායිම් ගම්මානවල සිදුවන සිදු වීම් නිසා දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ආකාරයට යම් යම් බලපෑම් ඇති වීම සිදුවේ. දැනට දිස්ත්‍රික්කය තුළ පවතින සාපේක්ෂ වශයෙන් සාමකාමී වූ පරිසරයට මේ මගින් බාධා සිදු විය හැකිය. මෙවැනි සිදු වීම් නිසා ජනතාව තුල අසහනය වර්ධනය වීමට මෙන් ම දිස්ත්‍රික්කය තුළ සිදුවන සංවර්ධන ව්‍යාපෘතිවලට බාධා පැමිණීමට ද පුළුවන.

### ක්‍රමෝපාය හා විකල්ප

දිස්ත්‍රික්කයේ පවතින සාපේක්ෂ සාමයට යටින් ගිනි පුපුරු තිබිය හැකි බැවින් ආරක්ෂක අංශ මනා අවධානයෙන් සිටිය යුතු වේ. මාලිගාවිල දී සිදු වූ ප්‍රහාරය එක් උදාහරණයක් පමණි.

## මඩකලපුව

### ව්‍යුහයන්

මඩකලපු දිස්ත්‍රික්කයේ සමස්ත තත්වය වැඩි දියුණු වී ඇති බව සඳහන් කළ යුතුය. ආරක්ෂාව තව දුරටත් වැඩි කර තිබුණත් ජනතාව තුළ පවතින නොසන්සුන්කාරී ස්වභාවය අඩු වී ඇත. මේ නිසා සවස් කාලයේ නිවසින් පිටතට පැමිණීම සම්බන්ධයෙන් වූ බිය පහව ගොස් ඇති ආකාරයක් පෙනේ. ටීඑම්වීපී

පක්ෂ නායක මුරලිදරන් පැවසූ අන්දමට නැගෙනහිර ප්‍රදේශයේ ළමා සොල්දාදුවන් පිළිබඳ ගැටලුව, රජය යුනිසෙෆ් සංවිධානය හා ටීඑම්වීපී පක්ෂය විසින් අත්සන් කරන ලද ඒකාබද්ධ ගිවිසුම මගින් ඉදිරි තුන් මාසය තුළ අවසන් වනු ඇත.මේ ගිවිසුම යටතේ මඩකලපුවේ විවෘත කරන ලද ළමා සුභසාධන කාර්යාලයට බාල වයස් සොල්දාදුවන් 14 දෙනෙක් භාර දී ඇති අතර තවත් ළමා සොල්දාදුවන් කිහිප දෙනෙක් ටීඑම්වීපී අත් අඩංගුවේ පසුවෙති. මේ ගිවිසුම යටතේ ළමා සොල්දුදාවන් වෙනුවෙන් පුනුරුත්තාපන පහසුකම් සැලසිය යුතු අතර ඔවුන් විසින් අත් දකින ලද ශාරීරික හෝ මානසික කම්පනයන් සමනය කර ගැනීමට ඔවුන්ට උපකාර සැපයිය යුතු වේ.

කාත්තන්කුඩි හි මුස්ලිම් පල්ලි සම්මේලනය විසින් සෙසු ප්‍රජා සංවිධානවල සහභාගීත්වයෙන් වන්නි ප්‍රදේශයේ යුද්ධයෙන් විපතට පත් වූවන් ට යැවීම සඳහා වියලි ආහාර ද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රියාමාර්ගයක් ආරම්භ කර ඇත. මෙය දිස්ත්‍රික්කය තුළ ප්‍රජාවන් අතර සහයෝගය ඇති කිරීම උදෙසා වූ යහ පියවරක් සේ දැක්විය හැකිය.

මේ අතර ප්‍රදේශයේ සංචාරයක යෙදුනු බ්‍රිතාන්‍ය මහකොමසාරිස් වරයා අම්පාර දිස්ත්‍රික්කයේ මායිම් ගම්මානවල සිවිල් වැසියන් ඉලක්ක කරගෙන සිදුවන ප්‍රහාර සම්බන්ධයෙන් සිය අප්‍රසාදය පළ කළේය.

**ක්‍රියාකාරීන්**

ටීඑම්වීපී, නැගෙනහිර පළාත් සභා සාමජිකයන්, දෙමළ හා මුස්ලිම් ප්‍රජාවන් හා රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සැලකිය හැකි වේ.

**ක්‍රියාත්මකවන ආකාරය**

ළමා සොල්දාදුවන් පිළිබඳ ගැටලුවට පැහැදිලි විසඳුමක් ලබා දීම දිස්ත්‍රික්කය පුරා විශාල ප්‍රබෝධයක් ඇති කිරීමට හේතු විය. දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මකවන ආකාරය සම්බන්ධයෙන් සළකා බලන විට මෙම ගැටලුව ඉතා වැදගත් එකක් බව පෙනී යයි. මක් නිසාද යත් එල්ටීටීඊ සංවිධානය හෝ ටීඑම්වීපී සංවිධානය විසින් සිය දරුවා ළමා සොල්දාදුවෙක් ලෙස බඳවා ගනීද යන කාරණය පිළිබඳව දිස්ත්‍රික්කයේ දෙමාපියන් නිරන්තර සිත් තැවුලෙන් පසුවන හෙයිනි.

**ක්‍රමෝපායන් හා විකල්ප**

රජය හා ප්‍රාදේශීය පාලනය විසින්, මුස්ලිම් පල්ලි සම්මේලනය විසින් කරගෙන යන වැඩපිළිවෙල හා සමාන වැඩපිළවෙළ දියත් කිරීමට දිරි ගැන්විය යුතු වේ. මේ තුළින් අන්තර් ප්‍රජා සහසම්බන්ධතාවන් වැඩි දියුණු කළ හැකිය.

එසේම ළමා සොල්දාදුවන් හැකි ඉක්මණින් පුනරුත්තාපනය කර ඔවුන් ආපසු සිය පවුල් වෙත යැවීමේ ක්‍රියාවලිය වඩාත් කඩිනම් කිරීමට රජය පියවර ගත යුතු වේ. මේ තුළින් විශාල මහජන විශ්වාසයක් දිනාගත හැකි වනු ඇත.

## කොළඹ

**ව්‍යූහයන්**

කොළඹ නගරය තුළ 2009 වර්ෂය ආරම්භ වූයේ ඛේදනීය අයුරෙනි. නව වසරේ මුලදිම මාධ්‍ය වෙත එල්ල වූ ප්‍රහාරයන් තුනක් වාර්තා විය. සිරස මාධ්‍ය ආයතනයට මැර ප්‍රහාරයක් එල්ල කළ අතර ප්‍රධාන පෙළේ සිංහල පුවත්පතක කර්තෘවරයෙකුට පහර දී තුවාල සිදු කිරීම හා ප්‍රධාන පෙළේ ඉරිදා පුවත්පතක කර්තෘවරයෙකු ඝාතනය විය. මෙය රටේ මාධ්‍ය නිදහස ද මරු පහරක් බව කියමින් මාධ්‍ය විසින් උණුසුම් විරෝධතා ව්‍යාපර දියත් කරනු දක්නට ලැබිණි.

මේ අතර මුලතිව් හා කිලිනොච්චි ප්‍රදේශ ජයග්‍රහණය කිරීම නිසා කොළඹ ප්‍රදේශය උද්දාමයෙන් ඇලලී ගොස් තිබිණි. බොහෝ නිවාසවල හා ගොඩනැගිලිවල ජාතික ධජය ප්‍රදර්ශනය කරනු දැකිය හැකි විය. දැඩි ආරක්ෂක රැකවල් මධ්‍යයේ නිදහස් දින උළෙලට සූදානම්වන ආකාරය දක්නට ලැබිණි. නිදහස් දිනයේ දී කොළඹට ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල විය හැකි බවට වූ බුද්ධි අංශ මතය දෙහිවල දී මරාගෙන මැරෙන ඇඳුම් කට්ටලයක් සොයා ගැනීමෙන් පසු තව දුරටත් තහවුරු විය.

කිලිනොච්චිය මුදා ගැනීමේ පුවත සැළ වීමත් සමග ම බස්නාහිර පළාත් සභාව විසුරුවා හැරීම සිදු විණි. මැතිවරණය පැවැත්වෙන දිනය ඉදිරියේ දී තීරණය වනු ඇත.

**ක්‍රියාකාරීන්**

ප්‍රධාන ක්‍රියාකාරීන් වන්නේ ආරක්ෂක හමුදා, දේශපාලන පක්ෂ හා මාධ්‍යයි.

**ක්‍රියාත්මක වන ආකාරය**

වාර්තාවලට අනුව යුද්ධය අවසානයට ළං වෙමින් තිබේ. දශක ගණනාවක කාලයක් තිස්සේ ආර්ථිකයට හා සිවිල් ජන සමාජයට බලපෑම් කරමින් තිබූ යුද්ධයේ අවසානය දැකීමට කොළඹ ජනතාව පුල පුලා බලා සිටිති.

මාධ්‍ය වෙත එල්ල වූ ප්‍රහාරයන් සමග ප්‍රවීණ මාධ්‍යවේදීන් කිහිපදෙනෙක් රට හැර යාමට පෙළඹී ඇත. මේ නිසා ආරක්ෂක තත්වය හා ආර්ථිකය වැනි මත භේදයට තුඩු දෙන කරුණු සම්බන්ධයෙන් වන තොරතුරු නිදහසේ ජනතාව වෙත ගලා යාමේ ක්‍රියාවලියට කිසියම් ආකාරයකින් බාධා පැමිණ ඇති බව පෙනේ.

**ක්‍රමෝපායන් හා විකල්ප**

මාධ්‍ය නිදහස තහවුරු කිරීමට රජය විසින් දැඩි පියවර ගත යුතුය. එසේම පාලනය පිළිබඳ ජනතා විශ්වාසය පවත්වා ගෙන යාමට නම් පොලිසිය හා වෙනත් වගකිව යුතු පාර්ශ්ව, මාධ්‍ය නිදහසට පහර එල්ල වන අවස්ථාවන් හි දි ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සියලු පියවර ගැනීමට කටයුතු කළ යුතු වේ.

## යාපනය

**ව්‍යූහයන්**

උතුරු ප්‍රදේශයේ ආරක්ෂක අංශ හා එල්ටීටීඊය අතර ගැටුම් වර්ධනය වෙද්දී යාපනයේ ආරක්ෂක තත්වය අස්ථාවරව පවතියි. විශේෂයෙන් ම අලිමංකඩ වැනි මර්මස්ථාන යටත් කර ගැනීමේ දී දෙපාර්ශ්වයට ම දැඩි සේ හානි සිදු විය. මෙහෙයුම්වල දී ආරක්ෂක අංශ විසින් පුපුරන ද්‍රව්‍ය පුරවන ලද මරාගෙන මැරෙන බෝට්ටු 100ක් සොයා ගන්නා ලදි.

දශක දෙකකින් අනතුරුව පළමු වතාවට යාපනය අර්ධ ද්වීපය රජයේ හමුදා යටතට පත් වී ඇත. මේ අනුව එල්ටීටීඊ සංවිධානය මුලතිව් දෙසට පසුබැස තිබේ. එසේම යාපනය මහ නුවර A9 මාර්ගය ද දශක දෙකකට පසු සම්පූර්ණයෙන් ම රජයේ පාලනයට නතු වී ඇති බව රජය ප්‍රකාශ කළේය.

දිගින් දිගටම පවතින ගැටුම් හේතුවෙන් වන්නි ප්‍රදේශයේ සිට අභ්‍යන්තර අවතැන්වූවන් විශාල සංඛ්‍යාවක් පැමිණෙනු ඇති බවට අපේක්ෂා කළත් එල්ටීටීඊ සංවිධානය මුහමලේ ප්‍රදේශයෙන් ඉවත් වීම සමග ඉතා සුළු අභ්‍යන්තර අවතැන් වූවන් ප්‍රමාණයක් පමණක් පැමිණියහ. රජය හා සහනසේවා ආයතන මෙසේ පැමිණෙමින් සිටින අවතැන් වූවන්ට අවශ්‍ය භාණ්ඩ හා සේවා සපයමින් සිටියි.

දෙසැම්බර් මාසයේ ඇති වූ ගංවතුර තත්වය හේතුවෙන් එළවලු වගාවන් විනාශ වී යෑම නිසා වෙළඳපළේ එළවලු මිල තාවකාලික ව ඉහළ ගොස් ඇත. මේ වන විට එය ක්‍රමයෙන් පහත බසිමින් තිබේ. කෙසේ වෙතත් දිස්ත්‍රික්කය තුළ ආහාර හිඟ වීමක් සම්බන්ධයෙන් වාර්තා වී නොමැත.

**ක්‍රියාකාරීන්**

ආරක්ෂක හමුදා, එල්ටීටීඊ සංවිධානය අන්තර්ජාතික රතු කුරුස සංවිධානය හා රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මකවන ආකාරය**

දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක වන ආකාරයට A9මාර්ගය යටත් කර ගැනීම වැදගත් වේ. යාපනය කොළඹ හා දිවයිනේ සෙසු ප්‍රදේශ යා කරණ තීරණාත්මක මාර්ගයක් සේ මෙය පවතියි. කොළඹ සිට සිදු කෙරෙන ගොඩබිම් ප්‍රවාහනය මේ නිසා වඩාත් කාර්යක්ෂම වනු ඇති බවට සිවිල් වැසියෝ අපේක්ෂාවෙන් සිටිති. එසේම A9මාර්ගය ඔස්සේ භාණ්ඩ ප්‍රවාහන කිරීම නිසා අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල ද පහල බසිනු ඇත.

එසේම ආරක්ෂක අංශ ඉදිරියට යෑම සම්බන්ධයෙන් ද සිවිල් වැසියෝ මහත් වූ බලාපොරොත්තු තබාගෙන සිටිති. දශක දෙකක් තිස්සේ ඔවුන් නොදැන සිටි සාමාන්‍ය ජීවිතය වෙත යෑමට ඔවුන් තුළ ඇත්තේ නොමඳ වූ ආශාවකි.

**ක්‍රමෝපායන් හා විකල්ප**

සිවිල් යුද්ධයෙන් වඩාත්ම පීඩාවට පත් යාපනයේ ජනතාව නන් අයුරින් පුනරුත්තාපනය කළ යුතුය. එල්ටීටීය තව දුරටත් පසු බසිත් ම සිවිල් වැසියන් කිසියම් අයුරක ආදායම් උපයන මාර්ගයන් හි යෙදවීම සඳහා රජය හා සහනසේවා ආයතන සිවිල් වැසියන්ට තාක්ෂණික වශයෙන් හා මූල්‍යමය වශයෙන් පහසුකම් සළසන ව්‍යාපෘති ඉදිරිපත් කළ යුතු වේ.

එසේම A9 මාර්ගය විවෘත කිරීම මගින් යාපනයේ වැසියන්ට දිවයිනේ සෙසු ප්‍රදේශ හා ගණුදෙනු කිරීමේ හැකියාව, අඩු මිලට භාණ්ඩ ලබා ගැනීමේ හැකියාව ආදී ප්‍රතිලාභ ලබා දිය යුතු වේ.

එසේම දිස්ත්‍රික්කය තුළ අන්තර් ප්‍රජා සහසම්බන්ධයන් මෙන් ම ආරක්ෂක තත්වය ද වැඩි දියුණු කළ යුතු වේ. මේ තුළින් සිවිල් වැසියන් ගේ ආරක්ෂාව තහවුරු කළ හැකි වනු ඇත.

# මන්නාරම

**ව්‍යූහය**

රජයේ හමුදා ජනවාර්ගික යුද්ධය අවසන් කිරීම සඳහා කටයුතු කරමින් සිටින අවස්ථාවේ කිලිනොච්චියේ හා මුලතිව් හි ගැටුම් සමග මන්නාරම් දිස්ත්‍රික්කයේ තත්වය බෙහෙවින් නොසන්සුන් වී ඇත. ෂෙල් ප්‍රහාර නිසා සිවිල් වැසියන් 50කට අධික ප්‍රමාණයක් මියගොස් තවත් සිය ගණනක් තුවාල ලබා ඇති බව වාර්තා වේ. සිවිල් වැසියන් ගැටුම් පවතින ප්‍රදේශවලින් ඉවත් වීම නිසා අභ්‍යන්තර අවතැන් වූවන් සංඛ්‍යාවද ඉහල යමින් පවතියි.

ධීවර ක්ෂේත්‍රයේ කිසියම් දියුණුවක් දක්නට ලැබෙන්නේ දන් ධීවරයින්ට දිවා කාලයට වඩා විශාල මත්ස්‍ය අස්වැන්නක් ලැබෙන රාත්‍රී කාලයේ මසුන් මැරීමට මෙන්ම ගැඹුරු මුහුදේ මසුන් මැරීමට ද අවසර ලැබී ඇති බැවිණි. සමහර ගොඩනැගිලි ද්‍රව්‍ය පාවිච්චිට තිබූ තහනම ලිහිල් කර ඇත. මන්නාරම තල්අඩි මාර්ගයේ කිලෝ මීටර් දෙකහමාරක ප්‍රදේශයක ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවන නිසා රැකියා අවස්ථා උත්පාදනය වී තිබේ. කෙසේ වෙතත් වී, වගා කළ හැකි මුළු භූමි ප්‍රමාණයෙන් වගා කටයුතු සිදු වන්නේ 50% ප්‍රමාණයක පමණි. දරුණු ගැටුම් පැවතීම නිසා වගා කළ හැකි භූමි ප්‍රමාණය අඩු වී ඇත.

වාර්තාවලට අනුව අදාල කාල සීමාව තුළ දී පැහැරගෙන යාම් සංඛ්‍යාව හා සෙසු පැරාමිලිටරි ක්‍රියාකාරකම් ඉහළ ගොස් ඇත.

**ක්‍රියාකාරීන්**

ආරක්ෂක අංශ, එල්ටීටීඊ සංවිධානය හා දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වර්තමාන සන්දර්භය තුළ ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සැලකිය හැකිය.

**ක්‍රියාත්මකවන ආකාරය**

විශාල වශයෙන් ඇදී එන අභ්‍යන්තර අවතැන් වූවන් දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ආකාරයට බලපෑමක් සිදු කරනු ඇත. මක් නිසාද යක් මේ පිරිසට අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් සැපයීමේ අතිරේක වගකීම රජය හා සහනසේවා ආයතන විසින් දැරිය යුතු වන බැවිණි.

**ක්‍රමෝපායන් හා විකල්ප**

රජය හා අන්තර් ජාතික රතු කුරුස සංවිධානය එක්වෙමින් පූනහෛයර් සිට මන්නාරමේ පේසාලේ දක්වා සීමිත බෝට්ටු සේවාවක් ඇරඹීම සම්බන්ධයෙන් සලකා බැලිය යුතු වේ. මෙතුලින් දරුණු ගැටුම් පවතින ප්‍රදේශවල හැර ඒමට අභ්‍යන්තර අවතැන්වූවන්ට හැකිවනු ඇත. එසේම මෙවැනි ම වූ සේවාවක් යාපනයේ කරික්කට්ටුවන් සිට පේසාලේ දක්වාත් ඇති කිරීමෙන් සිවිල් වැසියන්ට යාපනය දක්වා යාමට පහසු මගක් විවෘත වනු ඇත. එසේම මේ සඳහා සිවිල් වැසියන් විසින් වැය කළ යුතු අධික මුදල ද මේ මගින් අවම වීම සිදුවේ.

අභ්‍යන්තර අවතැන් වූවන් වෙනුවෙන් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා රජය හා සහන සේවා අයතන සතු වගකීම කිසියම් අයුරකින් අඩු කරන අටියෙන් අභ්‍යන්තර අවතැන් වූවන්ට සිය නෑ හිතමිතුරන් ගේ නිවෙස්වල නවාතැන් ගැනීම දිරිගන්වා ඇත. මෙයින් ඔවුගේ මානසික තත්වයට ද කිසියම් සහනයක් සැලසෙනු ඇත.

ඉහල යමින් පවතින ජීවන වියදමට සහන සැපයීමක් සේ ගෙවතු වගා වෙනුවෙන් ඇට වර්ග, පොහොර හා වෙනත් ආධාර ලබා දීම සිදු වේ. මේ නිසා දිස්ත්‍රික්කය තුළ ස්වයං පෝෂිතබවක් පවත්වා ගැනීමට හැකි වනු ඇත.

# ත්‍රිකුණාමලය

**ව්‍යූහයන්**

කිලිනොච්චි ප්‍රදේශයේ බලය ආරක්ෂක අංශ විසින් තහවුරු කර ගැනීමෙන් පසු ත්‍රිකුණාමලයේ තත්වය නොසන්සුන්කාරී බවට හැරී තිබේ. මුර සේවාවන් හා සෝදිසි මෙහෙයුම් නිරන්තරයෙන් සිදුවේ. මේවායේ මූලික අරමුණ වන්නේ පොලිසිය විසින් පවුල් කාඩ් පත්වල ලියාපදිංචි කරගෙන නොමැති පුද්ගලයින් හඳුනා ගැනීමයි. ආරක්ෂාව හා සම්බන්ධ සිදු වීම් කිහිපයක් ම වාර්තා වී ඇත. සුළු පිපිරීම් හා ක්ලෙමෝ බෝම්බ ප්‍රහාර නිසා ආරක්ෂක අංශ සාමාජිකයන් කිහිපදෙනෙක් මියගොස් ඇති අතර සිවිල් වැසියන් තුවාල ලබා ඇත.

ප්‍රධාන අමාත්‍යවරයා වෙත යෑම ඉතා දුෂ්කර කටයුත්තක්ව තිබේ. ඔහු ආරක්ෂක ජාලයකින් වටවී සිටින අතර ඔහුගේ කාර්යාලයට යන මාර්ගයේ පවා දැඩි මුරකාවල් යොදා තිබේ. ඔහුගේ කාර්යාලයට එන ඕනෑම පුද්ගලයෙකු ශාරීරික වශයෙන් පවා සෝදිසි කෙරේ.

ධීවර කර්මන්තය වැනි ආදායම් උපදවන මාර්ග සීමා වී තිබේ. සිවිල් වැසියන් දැඩි පීඩනයකට පත්ව සිටින අතර විශේෂයෙන් ම ඉහළ පන්තිවල දරුවෝ, විභාග සමත් වීම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ව පවතින ටියුෂන් පන්තිවලය යෑමට නොහැකි වීම නිසා අසහනයට පත් ව සිටිති. මේ හේතුව නිසාම සමහර දරුවෝ පාසැල් හැර දමා සිය පවුල වෙනුවෙන් ආදායම් ඉපයීම සඳහා රැකියා කිරීමට යොමු වී සිටිති.

බීබීසී මාධ්‍ය ආයතනය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී ප්‍රධාන අමාත්‍යවරයා කියා සිටියේ ප්‍රාදේශීය සභාවෙන් විමසීමකින් තොරව තාවකාලින හඳුනාගැනීමේ පත්‍ර සේ ආරක්ෂක අංශ විසින් සිවිල් වැසියන් ඡායාරූපගත කරන බවයි. මෙහිදී තව දුරටත් ඔහු ප්‍රකාශ කළේ දන් නැගෙනහිර පළාත් සභාව ප්‍රජාතන්ත්‍රවාදී පද්ධතියක් අනුව ක්‍රියාත්මක වන බවත් එවන් ප්‍රජාතන්ත්‍රවාදී පද්ධතියක් අවශ්‍යවන බවත්ය.

**ක්‍රියාකාරීන්**

ආරක්ෂක අංශ, රාජ්‍ය අධිකාරි, ටීඑම්වීපී හා රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධාන ක්‍රියාකාරීන් වේ.

**ක්‍රියාත්මක වන ආකාරය**

සහනසේවා ආයතනන සම්බන්ධයෙන් පනවා ඇති නව නීති රීති නිසා ව්‍යාපෘති සැලසුම් ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි ලා සිය ඵලදායීතාව සීමා කොට ඇති බව මේ ආයතන සිතයි.

ප්‍රදේශයේ ආරක්ෂාව දැඩි කර ඇති හෙයින් කිසියම් ආතතියක් ඇති වී ඇති බව පෙනේ. එසේම දෙමළ තරුණයන් සැලකිය යුතු ප්‍රමාණයක් සැක පිට අත් අඩංගුවට ගෙන ඇති බව වාර්තා වේ.

අභ්‍යන්තර අවතැන් වූවන් නැවත පදිංචි කරවීමේ වැඩ පිළිවෙල රජයේ හා රාජ්‍ය නොවන සංවිධානවල සහය ඇතිව සිදු කෙරේ. මෙහිදී මතු වී ඇති ගැටලුව වන්නේ මේ සඳහා සුදුසු භූමි භාගයන් සොයා ගැනීම අසීරු වීමයි.

මධ්‍යම රජය හා ප්‍රාදේශීය පාලනය අතර පවතින ගැටුම් හේතුවෙන් සෙසු සංවර්ධන කටයුතු අඩාල වී ඇති බව පෙනේ.

**ක්‍රමෝපායන් හා විකල්ප**

දනට පවතින සීමා මායිම් යටතේ තමාට හැකි තරම් කාර්යක්ෂම හා ඵලදායී ලෙස කටයුතු කිරීමට රාජ්‍ය නොවන සංවිධාන එකට එක් විය යුතුය.

අත් අඩංගුවට ගනු ලබන පුද්ගලයන්ගේ දෙමාපියන්ට හෝ නෑ හිත මිතුරන්ට එම අත් අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් දන්වීමට අදාළ බලධාරීන් විසින් කටයුතු කළ යුතු වේ.

# වවුනියාව

**ව්‍යූහයන්**

පැහැරගෙන යාම්, මංකොල්ල කෑම්, මිනී මැරුම් ආදී පැරාමිලිටරි ක්‍රියාකාරකම් ඉහල ගොස් ඇති බැවින් දිස්ත්‍රික්කය තුළ ආතතිය වර්ධනය වී ඇත. මුර සේවාවන් හා සෝදිසි මෙහෙයුම් නිරන්තරයෙන් සිදුවේ. වාර්තාවන අන්දමට සිවිල් වැසියන් 60කට අධික ප්‍රමාණයක් මරුමුවට පත් වී තවත් විශාල ප්‍රමාණයක් තුවාල ලබා ඇත.

වන්නියේ සිට පැමිණෙන අභ්‍යන්තර අවතැන් වූවන්ට සේවා සැපයීමේ වගකීම රජයේ හා සහනසේවා ආයතන මත පැටවී ඇත. මෙසේ පැමිණෙන අභ්‍යන්තර අවතැන් වූවන්ට නවාතැන් දීමේ අරමුණින් තාවකාලික මඩු ඉදිකර තිබේ. මේ අතර ඔමන්තෙයි මාර්ගය දින කිහිපයක් වසා තැබීම නිසා ඔමන්තෙයි දක්වා ගමන් කිරීමට අපේක්ෂාවෙන් සිටි සිවිල් වැසියන්ට බාධා පැමිණිනි.

පාසැල් සිසුන් 400 අධික ප්‍රමාණයක් හා විශ්වවිද්‍යාල සිසුන් 8 දෙනෙක් අභ්‍යන්තර අවතැන්වූවන්ගේ කඳවුරුවල ගාල් වී සිටිති. මොවුන්ට අධ්‍යාපනය සඳහා වන ඉඩ කඩ ඇහිරී තිබීම නිසා දෙමාපියන් සිත් තැවුලට පත් වී සිටිති.

ගොවියන් උස් බිම්වල වල වගා කල හැකි භෝග පමණක් වගා කටයුතු කරමින් සිටින්නේ ගංවතුර නිසා සෙසු වගා විනාශව ගොස් ඇති බැවිනි.දනට පවතින කුඹුරු වලින් වගා කෙරෙන්නේ 60 ප්‍රමාණයක් පමණි. ලෝක ආර්ථික අර්බුදය නිසා බොහොමයක් රාජ්‍ය නොවන සංවිධාන හා පෞද්ගලික ආයතන සිය සේවක ප්‍රමාණය කප්පාදු කරමින් සිටින හෙයින් ප්‍රදේශයේ විරැකියාව ඉහළ ගොස් ඇත.

**ක්‍රියාකාරීන්**

රාජ්‍ය ආයතන, ආරක්ෂක හමුදා, එල්ටීටීඊ සංවිධානය, අභ්‍යන්තර අවතැන්වූවන් හා රාජ්‍ය නොවන සංවිධාන ප්‍රධාන ක්‍රියාකාරීන් සේ සිටියි.

**ක්‍රියාත්මකවන ආකාරය**

මෙම දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මකවන ආකාරය කෙරෙහි බලපාන මූලික ම සාධකය වන්නේ මෙහි සීමාවේ පිහිටා ඇති මුලතිව් හි දරුණු ගැටුම් පැවතීමයි. පැමිනෙණ අභ්‍යන්තර අවතැන්වූවන්ගේ සංඛ්‍යාව ද ඉහළ යා හැකිය. මෙය රජයට හා සහනසේවා ආයතනවලට විශාල බරක් ව පවතියි. එසේම සාර්ථක අස්වනු නොලැබීම නිසා එළවලු ආදී ද්‍රව්‍ය සැපයීම ද විශාල බරක් වේ.

**ක්‍රමෝපායන් හා විකල්ප**

අභ්‍යන්තර අවතැන්වූවන්ගේ කඳවුරුවල සිටින පුද්ගලයින්ට තාවකාලික හෝ හැඳුනුම්පතක් ලබා දීම පිළිබඳව රජයේ අවධානය යොමු විය යුතුය. මෙසේ කල හොත් දිවා කාලයේ දී පාසැල් යාම, වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට යාම, භාණ්ඩ ගෙන ඒමට යෑම හා ඒ සියල්ලටම වඩා වැඩියෙන් රැකියා සඳහා යෑමට ඔවුන්ට ඉඩකඩ සැලසෙනු ඇත.

එසේම අභ්‍යන්තර අවතැන්වූවන්ට සිය නෑදෑ හිත මිතුරන් අතරේ නවාතැන් ගැනීමේ හැකියාව පිළිබඳවද සොයා බැලිය යුතු වේ. මෙමගින් රජයේ වගකීම කිසියම් දුරකට අඩු වනු ඇත. එසේම රජය යුනිසෙෆ් වැනි සහන සේවා ආයතන සමග එක්ව කටයුතු කරමින් දරුවන්ට ප්‍රමාණවත් සෞඛ්‍ය හා අධ්‍යාපන පහසුකම් ලබා දීම තහවුරු කළ යුතු වේ.

අප ගේ වෙබ් අඩවියට පිවිසෙන්න

http://www.humanitarian-srilanka.org/Knowledge_Centre/ Publications.php

මානුෂිය සේවායතන සමූහය විසින් ඉදිරිපත් කරනු ලබන **ක්ෂණික තතු විමසුම** මගින් මානුෂිය සේවා සහ සංවර්ධන කටයුතුවල නියැලෙන ආයතන සිය සැලසුම් සකස් කිරීමේ දී එක් එක් ප්‍රදේශයේ පවතින තත්ත්වය අවබෝධ කර ගැනීමෙන් එම ප්‍රදේශයේ අවශ්‍යතාවන්ට අනුකූලව මානුෂිය සහ සංවර්ධන කාර්යයන් සැලසුම් කර ගැනීමට ප්‍රයෝජනවත් වන තොරතුරු සැපයීමට අපේක්ෂා කරයි.

එමෙන්ම මෙම **ක්ෂණික තතු විමසුම** මගින් අදාල දිස්ත්‍රික්කයන්හි පවතින සාමයට ගොඩනැගීමට හෝ ගැටුම්වලට තුඩුදෙන සංවේදී තොරතුරු නිරාවරණය කරන හෙයින් ආයතනයන්ට එම ප්‍රදේශවල ගැටුම් ඇති නොවන ආකාරයට සහ ගැටුම් අවම කිරීම/සාමකාමී බවට පරාවර්තනය කිරීමට හා සාමය ගොඩනැංවීමට උපරිම අයුරින් දායක විය ආකාරයෙන් කටයුතු කළ හැකිය.

අවදානම් තත්ත්වය තක්සේරු කිරීම මගින් ආයතනයන්ට තම මෙහෙයුම් කටයුතුවල නියැලෙන අතර සිය සේවකයන් ගේ සහ එම ආයතන කටයුතු කරන ප්‍රදේශයේ ජනතාව ගේ ආරක්ෂාව ද තහවුරු කිරීමට හැකියාව ලැබේ.

බාහිර පාර්ශවයන් සලකා බැලීමේ දී (පොදු ජනතාවල ජාත්‍යන්තර ප්‍රජාව) සංදර්භ විශ්ලේෂණය මගින් උද්දේශන සඳහා අවශ්‍යය වන ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්කයන්හි පවතින තත්ත්වය පිළිබඳව ප්‍රමාණවත් මෙන්ම සමබර තොරතුරු ලබාදෙයි.

මෙම වාර්තාව පිළිබඳව ඔබගේ අදහස් සහ යෝජනා දැනගැනීමට අපි කැමැත්තෙමු. අපගේ ඊ-මේල් ලිපිනය feedback@cha.lk

මානුෂීය සේවායතන සමූහය,
30/81, ලොන්ඩන් පෙදෙස,
කොළඹ 7

දුර/ෆැක්ස්: 94-112506855/2598413